# ජලය වනාහි එලදායී මතින මිනුම් දණ්ඩකි

දකුණු දිග ආසියාවෙහි ගොවි කටයුතුවල වෙනස් වීම් අලළා (බ්‍රිතාන්‍යයේ) කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයත්, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයත්, එක්ව පැවැත් වූ පර්යේෂණයකට හවුල් වී ක්‍රියා කළ ආචාර්ය රොබට් චේම්බර්ස් විසින් ශ්‍රී ලංකාවේ වියළි කලාපයෙහි ජල පාලනය හා වී ගොවිතැන පිළිබඳව ඉදිරිපත් කරන ලද වාර්තාවකින් මේ ලිපිය සකස් කෙරිණි.

වාරි ක්‍රම භාවිතා වෙන කෘෂිකාර්මික කටයුතුවලට අදාළ ජල පාලනය කෙරෙහි ජාත්‍යන්තර වශයෙන් වැඩි වැඩියෙන් අවධානය යොමු වන්නට පටන් ගෙන තිබේ. ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වරක් ප්‍රකාශයක් කරමින් වගා කෙරෙන බිම්වල නිෂ්පාදිතය වැඩි කිරීමට රට රටවල් දූන් පෙළඹ ඇති නිසා වඩාත් දියුණු නවීන කෘෂිකාර්මික ශිල්ප ක්‍රම උපයෝගී කර ගැනීමට සිදුව ඇති බව ද, මේ සියල්ලෙන් ම සමහර විට වඩාත් වැදගත් වනුයේ ජල සම්පත වඩාත් එලදායී ලෙස පාවිච්චියට ගැනීම බව ද සඳහන් කෙළේ ය.

වියළි කලාපයෙහි ජල පාලනය වනාහි සැලැකිල්ලක් නොදක් වූ විෂයක් හැටියට හැඳින් විය හැකි ය. මහවැලි ගඟට අදාළ (එක්සත් ජාතීන් ගේ සංවර්ධන සැලසුම / ආහාර හා කෘෂිකර්ම සංවිධානය) අවසාන වාර්තාව වූ කලී වෙනත් කෘෂිකාර්මික යෙදවුම්ද ජලය නොසලකා හැරීම පිළිබඳ ඒවායෙහි පාලනය ද කෙරෙහි අවධානය යොමු කිරීම අතින් විශේෂත්වයක් ගන්නකි. ගොවිපල මට්ටමින් ජල පාලනය පිළිබඳව 1973 දී පැවැති ආහාර හා කෘෂිකර්ම සංවිධාන / ශ්‍රී ලංකා ඒකාබද්ධ සම්මන්ත්‍රණයෙහි වාර්තාව මෙම විෂයය කෙරෙහි අවධානය යොමු කිරීමට තුඩු දුන් අතර ජල පාලනය පිළිබඳ ඉතා වැදගත් සංවිධානමය හා ක්‍රියාත්මක අංග සම්බන්ධ දැනීමෙහි අඩු ලුහුඬුකම් ද, සැලකිල්ල ද එළිදරවු කරන්නකි.

මෙහිලා ජල පාලනය යනු සැපයුම් ස්ථානයේ (ඇනිකට් හෝ වැව්) පටන් සැපැයෙන ස්ථානය දක්වා ජලය බෙදා හැරීමත්, පංගු වෙන් කිරීමත්, වහනය කිරීමත් සම්බන්ධ පාලනය හා ක්‍රියාකාරීත්වය ද හැටියට දක්විය හැකි ය.

වියළි කලාපයෙහි සාමාන්‍ය වර්ෂාපතනය මාස් කන්නයට අඩි 3.1 ක් ද, යලට අඩි දශම .9 ක් ද හැටියට ගනු ලැබිය. ප්‍රමාණය හා සංවිධාන ක්‍රමය ද අනුව වාරිමාර්ග පද්ධතීන් (i) ප්‍රධාන යෝජනා ක්‍රම (ගල්ඔය, උඩවලවේ, මහවැලි ගඟ) (ii) ප්‍රධාන, සහ (iii) සුළු යනු විසින් කොටස් කළ හැකි ය. ප්‍රධාන යෝජනා ක්‍රම සහ ප්‍රධාන වාරිමාර්ග ක්‍රමයන්හි ජලය නිල කාර්යංශ මගින් ද, සුළු වාරිමාර්ග ක්‍රමයන්හි ජලය කිසියම් ගොවීන් සමූහයක් මගින් ද පාලනය කෙරේ. ප්‍රධාන වාරිමාර්ග ක්‍රමයන්හි මූලික සීමාවක් නම් කිසියම් යායක වෙසෙන ගොවීන් අතින් පාලනය කරනු පිණිස නිල කාර්යාංශයක පාලනයෙන් ජලය මුදා හැරෙන අවස්ථාවය.

වියළි කලාපයට අයත් දිස්ත්‍රික්කයන්හි 1973/74 මාස් කන්නයේ වී වගාව සඳහා ඉලක්ක කර ගෙන තිබුණු බිම් ප්‍රමාණය අක්කර 9,00,000 ක් වූ අතර, එයින් අක්කර 3,90,000 ක් ප්‍රධාන යෝජනා ක්‍රම සහ ප්‍රධාන වාරි ක්‍රම ද, අක්කර 2,30,000 ක් සුළු වාරිමාර්ග ක්‍රමද යටතේ විය. ඉතිරි කොටස වර්ෂා ජලයෙන් වගා කෙරෙන බිම් ය. පස් අවුරුදු කාලයක් තුළ දී මෙම දිස්ත්‍රික්කයන්හි වාර්තා වූ එලදාවෙහි මාධ්‍යකය මාස් කන්නය සඳහා අක්කරයකට බුසල් 48.9 ක් ද, යල සඳහා අක්කරයකට බුසල් 49.9 ක් ද වූ අතර,

කන්න අතර ඵලදාවෙහි වෙනස සැලැකිය යුතු තරම් නොවිය. පසුගිය දශකය තුළ ජාතික වී නිෂ්පාදිතයෙහි වැඩිවීම අක්කර ප්‍රමාණයෙහි වැඩිවීමට වඩා ඵලදාවෙහි වැඩි වීම නිසා ඇති වූ ප්‍රතිඵලයක් හැටියට දක්වීමට පුළුවන. ජාතික වී නිෂ්පාදිතයෙන් පහෙන් තුන් පංගුවකට වඩා වියළි කලාපයෙහි ද, තුනෙන් පංගුවකට වඩා ප්‍රධාන වාරි ක්‍රම යටතෙහි ද නිෂ්පාදනය කෙරේ. (සැ. යු. - වාර්තාව සඳහා දත්ත රැස් කරන ලද්දේ 1975 ට පෙර ය.) යහපත් ජල පාලනයක් වෙතොත් ඵලදාව ඉහළ යාමෙන් හෝ අක්කර ප්‍රමාණය ඉහළ යාමෙන් හෝ ඒ දෙකින් ම හෝ වියළි කලාපීය වී නිෂ්පාදනය වැඩි විය හැකි ය.

### ජලය හිඟ සම්පතකි.

වියළි කලාපයෙහි ජලය **ඉඩම්වලටත් වඩා හිඟ සම්පතකි. වාරි පහසුකම් නොසැපයෙන තත්ත්වයන් යටතේ ඉඩමත්, වර්ෂා ජලයත්, අතරෙහි ඉතා සමීප සබඳතාවයක් ඇති අතර, අක්කරයකට ඵලදාව ඒකක ජල ප්‍රමාණයකට ඵලදාව ද පෙන්නුම් කරන්නකි.** වාරි පහසුකම් සැපැයෙන තත්ත්වයන් යටතේ මෙය වලංගු නොවේ. ජලය ඉඩම් වර්ධකයක් වන අතර වගා කරන ලද ඉඩම් ප්‍රමාණය යපයන ලද ජල ප්‍රමාණය මත රඳා පවතී. ඉඩම් අළුතින් වගා කිරීම හෝ දැනටමත්, අස්වද්ද ඇති ඉඩම්වල වගා වාර ගණන වැඩි වීම හෝ තුළින් වගා අක්කර ප්‍රමාණය වැඩි කිරීමට වැඩිපුර ජලය හෝ වැඩිපුර ජල භාවිතය හෝ හේතු සාධක වෙයි. අක්කරයකට නිෂ්පාදිතය හා ඵලදාව ද මත වගාව ගැන ගොවීන් දිගින් දිගටම කල්පනා කරනවා විය හැකි නමුදු ජාතික වශයෙන් ඇති වැදගත්කම සලකන කෘෂිකාර්මික සැලැසුම් කරුවන් හා වෙනත් අය ද ජල ඒකකයකට නිෂ්පාදිතය හා ඵලදාව ද මත වගාව ගැන කල්පනා කිරීම අවශ්‍ය ය.

වර්තමාන ජල පාවිච්චියෙහි දී විශාල වශයෙන් ජලය අපතේ යයි. උඩවලවේ කොටසකට මාස් කන්නය සඳහා අක්කර අඩි 16 (අක්කරයක බිම් කොටසක් අඩියක් උසට ජලයෙන් පිරී ගියවිට අක්කර අඩි එකකි.) කට වැඩි ජල නිකුතුවක් ද, ගල්ඔයේ යල සඳහා අක්කර අඩි 18 ක ජල භාවිතයක් ද වාර්තා විණි. පර්යේෂණවලින් හෙළි වූ පරිදි (ගලායාමේ දී නැතිවන කොටස හැටියට සීයට 25 ක් ද, ලියැදිවලින් උතුරා යන කොටස හැටියට තවත් සීයට 15 ක් ද අත හැර) මාස් කන්නය සඳහා දළ වශයෙන් අක්කර අඩි 1 සිට 3 දක්වා ප්‍රමාණයක් සහ යල සඳහා අක්කර අඩි 5 සිට 8 දක්වා ප්‍රමාණයක් ද යනුවෙන් වූ ප්‍රධාන වාරි ව්‍යාපාරයන්හි (සොරොව් වලින් බාහිර) ජල අවශ්‍යතාවය හා මෙය සැසැඳේ. එහෙත් ලියැදිවල සැබෑ ජල පාවිච්චිය මාස් කන්නය සඳහා අක්කර අඩි 3 සිට 5 දක්වා ප්‍රමාණයක් ද, යල කන්නය සඳහා අක්කර අඩි 6 සිට 8 දක්වා ප්‍රමාණයක් ද වේ. මේ අනුව, පෙනී යන්නේ යල සමඟ සසඳන කළ මාස් කන්නයේ දී ජලය බෙහෙවින් නාස්ති වන බව ය. මේ ගණන් බැලීම් අනුව මාස් කන්නයේ දී අවශ්‍යතාවය මෙන් දෙගුණයක් පමණ ජලය නිකුත් කරන බව පෙනී යයි. ජලය වඩාත් අරපරිස්සමින් යොදා ගත හොත් උතුරා අපතේ යාමෙන් වන පාඩුව වළකා ගෙන තැන්පත් ජලයෙන් ගත හැකි ප්‍රයෝජන බෙහෙවින් වැඩි කර ගත හැකි ය.

### ජලය සුරැකීම

**අතිරික්ත ලෙස ජලය නිකුත් කිරීම කෙරෙහි බලපාන සාධක අතරට නුසුදුසු පසට ජලය සැපයීම, ජල පාලන උපක්‍රම නඩත්තු කිරීමට අපොහොසත් වීම, වගා කටයුතුවල දී ගොවීන් අනුගමනය කරන නොයෙකුත් ක්‍රියා විධි ආදිය අයත් වේ. සංවිධානය හා පාලනය මගින් ද, ජලය සැපැයීමේ හා වගා කිරීමේ සුදුසු ක්‍රම භාවිතය වැනි ක්‍රියා විධි මගින් ද අතිරික්ත ලෙස ජලය නිකුත් කිරීම් අඩු කර ගත හැකි ය.**

වියළි කලාපයේ ජල භාවිතය පිළිබඳ පොදු මතය නම් මාස් කන්නයේ දී ජලය ඉතිරි කර ගෙන යල සඳහා රැස් කර තබා ගත යුතුය යන්නය. හම්බන්තොට දිස්ත්‍රික්කයේ වීරවිල වැව වැනි වැවක් සම්බන්ධයෙන් සළකා බැලුවහොත් මාස් කන්නයේ දී රැස් කර තබා ගන්නා ලද ජලයෙන් යල කන්නයේ දී වගා කළ හැකි අක්කර ප්‍රමාණය එම ජල ප්‍රමාණය යොදා මාස් කන්නයේ දී වගා කළ හැකි අක්කර ප්‍රමාණයෙන් කාලක් පමණ වෙයි. මෙයින් තේරුම් ගත හැක්කේ මාස් කන්නයේ දී ම අතිරේක අක්කර ප්‍රමාණයක් වගා කිරීමට එම ජලය යොදා ගැනීම වඩාත් කාර්යක්ෂම වන බව ය. ඵලදාව වැඩි කිරීමේ මාර්ගයට වඩා

විශේෂයෙන් ම මාස් කන්නයේ දී අක්කර ප්‍රමාණය ව්‍යාප්ත කිරීමේ මාර්ගයෙන් නිෂ්පාදිතය වැඩි කිරීමේ අවශ්‍යතාවය මෙයින් පෙනී යයි.

බොහෝ අවස්ථාවල මෙන්ම බොහෝ ප්‍රදේශ වලද විශේෂයෙන් ම ප්‍රධාන වාරි යෝජනාක්‍රම යටතේ යල සඳහා ද ජලය රැස් කර තැබීමේ අවශ්‍යතාවය තවදුරටත් පෙනෙන්නට ඇත. නමුත් වඩා සුදුස්ස තෝරා ගැනීමේ අවශ්‍යතාවය පවත්නා ස්ථානවල මාස් කන්නයේ අතිරේක ලෙස වගාව සඳහා ජලය පාවිච්චි කිරීම වඩාත් ඵලදායි වන බව පෙනෙන්නට ඇත. මෙහිලා අවශ්‍යතාවය නම් මාස් කන්නයත් බොහෝ දුරට ජලය හිඟ යල කන්නය මෙන් ගොවීන්ට ඒත්තු ගැන්වෙන ආකාරයට මාස් කන්නයේ දි දැඩි ලෙස ජලය පාලනයකි.

නියම කලට වැඩ කිරීම ද, පලින් පල හිතුමනාපයට වැඩ කිරීම ද සංකීර්ණ ප්‍රශ්නය. හිතුමනාපයට කාල නියමයක් නොසලකා පලින් පල වැඩ කිරීම යායයන් තුළත් ප්‍රධාන යෝජනා ක්‍රම හා ප්‍රධාන වාරිමාර්ග යටතේ යායයන් අතරෙහිත් සිදු වෙන දෙයකි. හිතුමනාපයට පලින් පල කාල නියමයක් නොසලකා වැඩ කිරීමට හේතු සාධක වන කරුණු අතර ස්වභාවික ආපදවන්, ජල සැපයුමෙහි පිළිවෙළ, ජල වහනයේ බලපෑම්, ශ්‍රමය ඇතුළු යෙදවුම් පිළිබඳ ප්‍රශ්න, පැහෙන්නට කල්ගත වන වී වර්ග වැපිරීම, වාරි මාර්ග වැඩ නඩත්තු අවශ්‍යතාවයන් සහ ගොවි ශ්‍රමය සඳහා තරහකාරී ඉල්ලුම ද වේ.

**පලින්පල වැඩ කිරීමෙහි වාසි, අවාසි**

හිතුමනාපයට පලින් පල වැඩ කිරීම එතරම් යෝග්‍ය නොවන බව සාමාන්‍ය පිළිගැනුම ය. එසේ වුව ද, අවදානම අඩු කිරීම, ස්ථාවර ආහාර සැපැයුමක් පවත්වා ගෙන යාම, හිඟ යෙදවුම් පිළිබඳ ඉල්ලුම ලිහිල් කිරීම, ඇළ මාර්ග හා කාණු පිළිබඳ ඉල්ලුම සම තත්ත්වයක පවත්වා ගෙන යාම, ජලය නැවැත වරක් පාවිච්චි කරන අය සඳහා ජල වහනය ස්ථායි කිරීම, මුල් අවස්ථාවෙහිදී ම වාගේ වගා හානියකට පාත්‍ර වන අයට නැවත වරක් වගා කිරීමට අවස්ථාවක් සැලැසීම (සමහර විට) ඉඩම් නැති කම්කරුවන්ට රැකියා සඳහා වඩාත් ස්ථාවර තත්ත්වයක් ඇති කිරීම, ආදී කරුණු අතින් සැලකිය යුතු ප්‍රයෝජනයක් එයින් අත් වේ. වඩාත් දිලිඳු ගොවීන්ට ද එයින් ප්‍රයෝජනයක් සැලැසේ.

කල් යල් නොබලා පලින් පල වැඩ කිරීම, කාල නියමයක් නොමැති වීම සහ නියමිත වකවානු ඉක්මවා ජල සැපැයුම දීර්ඝ කිරීම යන කරුණු අද ඊයෙක ඇති වූවක් නොව, දීර්ඝ ඉතිහාසයක් ඇති ඒවා ය. පලින් පල වැඩ කිරීම සහ කාල නියමයක් නොමැතිවීම ද නිසා එක අතකින් සිදු වන අනර්ථයද විශාල ය. දේශ ගුණික සාධක වලින්, වගා ආරක්ෂණය පිළිබඳ දුෂ්කරතා වලින්, ජල පාලනය පිළිබඳ ප්‍රශ්නවලින්, ජල ගැලීම් වලින්, අසල්වැසි ගොවීන් අතරෙහි හට ගන්නා ආරවුල් වලින් සහ කන්නයන් අභිමිව යෑමෙන් ද අක්කරයක ඵලදාවට හානි පැමිණේ. වර්ෂාවෙන් ප්‍රයෝජන ගැනීමට අපොහොසත් වීමෙන් සහ වාෂ්පීකරණය, වැස්සීම හා ගලා යාමේ දී සිදු වන නැතිවීම් ද මගින් ජල පාවිච්චියෙහි කාර්යක්ෂමතාවයට හානි පැමිණේ. කල් යල් නොබලා පලින් පල වැඩ කිරීමෙන් නඩත්තු, ව්‍යාප්ති කටයුතු ආදිය වඩාත් දුෂ්කර වෙන අතර, සංඛ්‍යා ලේඛන රැස් කිරීම සංකීර්ණ කටයුත්තක් බවට ද පත් වේ.

කාල නියමයක් නොබලා පලින් පල වැඩ කිරීම හැකිතරම් සීමා කළ හොත් ඉඩමෙනුත්, ජලයෙනුත් වැඩි වැඩියෙන් ඵල ප්‍රයෝජන ගත හැකි නමුත් මේ කාරණය මත දුර්වල තත්ත්වයේ ගොවීන්ට (අනිසි ආකාරයෙන් දඬුවම් නොපැමිණ-වීම) සිදුවන පාඩුව වැළැක්වීම සඳහා සැලැකිලිමත් විය යුතුව ඇත.

**බෝග හා වී වර්ග තෝරා ගැනීමෙන් ද ජල යෙන් ගත හැකි ඵල ප්‍රයෝජන වැඩි කර ගත හැකි ය. බීජී 34/6 බීජී 34/8 වැනි කෙටි කාලීන වී වර්ග එච් 4 ට වඩා අඩුවෙන් ජලය උපයෝගී කරගන්නා අතර යහපත් ජල පාලනයක් හා සැපැයුමක් ද යටතේ ජල ඒකකයක් හා සමහර විට ඉඩම් ඒකකයක් ද සඳහා එහි ඵලදාවට ද වඩා ඉහළ ඵලදාවක් ලබා දෙනු ඇත.**

විදේශ විනිමයත්, ජලය සහ ශ්‍රමයත් අතරෙහි විවිධ ආදේශන ඇති විය හැකි ය. පැල සිටුවීමත්, වල් නෙලීමත් මගින් ජලය වෙනුවට ශ්‍රමය යොදා ගැනීමට පුළුවන. එහෙත් ජලය ලබා ගැනීමට

හැකිතාක් කල් කුමන ප්‍රමාණයකින් හෝ එවැනි ආදේශකයක් ගොවීන් විසින් යොද ගනු ලැබේ යයි සිතිය නොහැක. මෙහිලා අවශ්‍ය දෙය ප.මී, පෞද්ගලික මතිමතාන්තර හෝ ලාභ ප්‍රයෝජන හෝ ගැන නොතකා ජාතික වශයෙන් පුළුල් මට්ටමින් සිතා ජලය වැඩිපුර අවශ්‍ය ගොවීන්ට වැඩිමනත් ජලය සැපැයීමට කටයුතු සැලැස්වීම ය.

**සාධාරණ ලෙස ජලය බෙදීම**

ජල සැපැයුම් ඇළ මාර්ගයන් හි මුලටම නොහොත් ඉහත්තාවේම වගා කරන අය හෝ වඩාත් බල පුළුවන් කාර අය හෝ යායයන් ඇතුලත ජල සැපැයුමින් වැඩිපුර ඵල ප්‍රයෝජන අත්කර ගන්නා අතර, ඇළ මාර්ගයන්හි ඉතා පහළින් වගා කරන අය ගේ අයහපතට එය හේතු වෙයි. මේ ප්‍රශ්නයට විසඳුමක් සෙවීමේ දී යොද ගත හැකි උපක්‍රම අතර ගොවියාට අධ්‍යාපනයක් ලබා දීම, ජල චාලක (වාර්ජර්) ක්‍රමයක් හඳුන්වා දීම; සුපරීක්ෂාකාරී ලෙස වාරි ව්‍යුහයන් සැලසුම් කිරීම, වගා කොමිටි වැනි සංවිධාන සඳහා යායයන් තුළින් (යායෙහි කාටත් සාධාරණ අන්දමේ) නියෝජිතයන් පත් කිරීම, ජලය බෙද හැරීම සඳහා නිසි බලතල සහිත පුද්ගලයෙකු තෝරා ගැනීම ආදිය වේ.

කේම්බ්‍රිජ් විශ්ව විද්‍යාලයත්, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයත් එක්ව ශ්‍රී ලංකාවේ අග්නිදිග වියළි කලාපයෙහි කරන ලද සමීක්ෂණයේ දී හෙළි වූ කරුණු මගින් ගොවීන් අතුරින් වැඩි පිරිසක් වඩාත් දැඩි ජල පාලන ක්‍රමයක් සඳහා කැමැත්ත දක්වනු ඇතැයි පැවැසිය හැකි ය. එවැනි ජලපාලන ක්‍රමයක් වඩාත් හොඳින් ක්‍රියාත්මක කළ හැකි වනුයේ වාරි ක්‍රමය ගැන දනුම් තේරුම් ඇති එසේම තීරණ ගැනීමෙහි නිදහස ද ඇති, කාගෙත් පිළිගැනුමට පාත්‍ර වූ කෙනෙකුට ය. මාස් කන්නයේ ඕනෑකමින් ජල හිඟකම් ඇති කෙරෙන අවස්ථාවක දී එවැනි නායකයෙකුට විශේෂ වැඩ කොටසක් ඉටු කිරීමට සිදු වන අතර, වාරි මාර්ගයෙහි පහළ කොටස්වල ගොවීන් තමන් ගේ ජල අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා වඩ වඩාත් බලපෑම් ඇති කරන පිරිසක් බවට එවිට පත් වනවා ඇත. (වෙල්විදානේ ක්‍රමය හා සමාන අලුත් ක්‍රමයක් මහවැලි වැඩ පිළිවෙළ යටතේ ගොවීන්ට හඳුන්වා දීමට පියවර ගෙන ඇත. වළගම්බාහුව ලිපිය බලන්න).

ජලය බෙද හැරීමේ ප්‍රමාණයන් හා කාල සීමාවන් ද පිළිබඳව දිසාපති වරුන් ගේ ප්‍රධානත්වයෙන් පැවැත් වෙන රැස්වීම් ඇත. මෙම රැස්වීම් ක්‍රමය ඵලදායි වන අතර, සභාපති අපක්ෂපාතී කෙනකු විය යුතු ය. කෙසේ වෙතත්, මෙම රැස්වීම්වල දී යායයන් අතර ජල පංගු වෙන් කිරීම පිළිබඳව නිරන්තරයෙන් සළකා බැලීමක් නැත. විශේෂ නියමයක් හෝ අනුබලයක් හෝ නොමැති කළ විශේෂයෙන් ම මාස් කන්නයේ දී ජලය නිකුත් කිරීමෙහි වගකීම බාර නිලධාරීන් විසින් අනුදත් පරිද්දෙන් ජලය නිකුත් කිරීමට පෙළඹෙන අතර වැඩිපුරම මෙය දක්නට ලැබෙන්නේ ප්‍රධාන වාරි යෝජනා ක්‍රමවල ය.

මාස් කන්නයේ දී අක්කර විශාල ප්‍රමාණයකට ජලය ලබා දීම සඳහාත්, යල වෙනුවෙන් ජලය ඉතිරි කර ගැනීම සඳහාත් ඕනෑකමින් ම අඩු ප්‍රමාණයකින් ජලය සැපැයීම අවශ්‍ය වන අතර, එවැන්නක් කළ හැකි වනුයේ ගොවීන් හා ගොවි කණ්ඩායම් විසින් ඉල්ලුම් කරනු ලබන ප්‍රමාණයට වඩා අඩුවෙන් ජලය නිකුත් කිරීමට ජලය පාලනය කරන අය පෙළඹවුවහොත් පමණි. මේ සඳහා වැදගත් වන පියවරවල් දෙකකි. සියළුම ප්‍රධාන වාරිමාර්ග ක්‍රම වෙනුවෙන් දිසාපති, දිස්ත්‍රික් කෘෂිකර්ම ව්‍යාප්ති නිලධාරී හා ගොවි නියෝජිත යන් ගේ ද සහභාගිත්වය ඇතුව ජලය නිකුත් කිරීමේ ක්‍රියා පටිපාටිය හා ජල පංගු ද තීරණය කිරීම ඉන් පළමුවැන්න ය. දෙවැන්න වනුයේ ජල පාලනය සඳහා සකස් කෙරෙන ස්ථිර ක්‍රමය කට ඉහළ ම දේශපාලන මට්ටමින් පැහැදිලි සහයෝගයක් දීම ය.

★ ★ ★

**“අහසින් වැටෙන එකද වැහි බිඳකුදු මනුෂ්‍ය ප්‍රයෝජනයම නොගෙන මුහුදට ගලා යාමට ඉඩ නොදිය යුතු ය.”**

**මහාවීර මහා පරාක්‍රමබාහු රජතුමා**
(ක්‍රි. ව. 1153 – 1186)